# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2025.03.10** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය).

**1. පද්ධති සැලසුම්කරු (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01)**

**1.1 වැටුප් පරිමාණය:-**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.52,955-5x1,335/8x1,630-72,670/- වේ (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.129,000/- පමණ වේ).

**1.2 වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

**1.3 අධ්‍යාපන සුදුසුකම්:-**

පරිගණක විද්‍යාව/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT)/තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් තිබීම.

**1.4 පළපුරුද්ද:-**

බාහිර අයදුම්කරුවන් සඳහා - සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පද්ධති සැලසුම්කරුවෙකු ලෙස වසර පහකට (05) නොඅඩු පළපුරුද්දක් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා - සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වසර අටකට (08) නොඅඩු පළපුරුද්දක් තිබීම.

**1.5 බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**2. දත්ත පදනම් පාලක (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01)**

**2.1 වැටුප් පරිමාණය:-**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.52,955-5x1,335/8x1,630-72,670/- වේ (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.129,000/- පමණ වේ).

**2.2 වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

**2.3 අධ්‍යාපන සුදුසුකම්:-**

පරිගණක විද්‍යාව/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT)/තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් තිබීම.

**2.4 පළපුරුද්ද:-**

බාහිර අයදුම්කරුවන් සඳහා - සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව දත්ත පදනම් පාලකවරයෙකු ලෙස වසර පහකට (05) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා - සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වසර අටකට (08) නොඅඩු පළපුරුද්දක් තිබීම.

**2.5 බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**3. පරිගණක වැඩසටහන් සම්පාදක (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01)**

**3.1 වැටුප් පරිමාණය:-**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.43,565-9x755/6x930-55,940/- වේ (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.104,000/- පමණ වේ).

**3.2 වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

**3.3 අධ්‍යාපන සුදුසුකම්:-**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමන ලද පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/තොරතුරු පද්ධති පිළිබඳ උපාධියක් තිබීම

**සහ**

සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබීම.

**3.4 පළපුරුද්ද:-**

සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පරිගණක වැඩසටහන් සම්පාදකවරයෙකු ලෙස PHP, Java, JavaScript භාවිතයෙන් වෙබ් පාදක පද්ධති සංවර්ධනය සහ MSSQL, MySQL භාවිතයෙන් RDBMS පිළිබඳ වසර තුනකට (03) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

HTML, CSS, jQuery සහ Bootstrap වැනි Responsive Framework පිළිබඳ ප්‍රවීණත්වය සමග ගැටළු විසඳීමේ හැකියාව ඉහළ මට්ටමින් තිබීමත්, අවම අධීක්ෂණය යටතේ ස්වාධීන ව වැඩ කිරීමේ හැකියාවක් තිබීමත් වඩාත් යෝග්‍ය වේ.

PHP Framework පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

**3.5 බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**4. සහකාර පරිගණක වැඩසටහන් සම්පාදක (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01)**

**4.1 වැටුප් පරිමාණය:-**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.34,605-9x660/3x755-42,810/- වේ (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.90,000/- පමණ වේ).

**4.2 වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**4.3 අධ්‍යාපන සුදුසුකම්:-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් හතරකින් (04) සමත් වී තිබීම/ (නව නිර්දේශය) එකවර විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම

**සහ**

සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි/ඉංග්‍රීසි සාහිත්‍යය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබීම.

**4.4 වෘත්තීය සුදුසුකම්:-**

රජය විසින් පිළිගනු ලබන ආයතනයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

**4.5 පළපුරුද්ද:-**

PHP සහ MySQL පිළිබඳ පළපුරුද්දක් තිබීම වඩාත් යෝග්‍ය වේ.

**4.6 බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**5. පරීක්ෂණ පටිපාටිය:-**

(අ) ලිඛිත/වෘත්තීය පරීක්ෂණය

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයේ දී රැකියා කාර්යභාරය හා සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කර බලනු ලබන අතර, ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

(ආ) සම්මුඛ පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයෙන් ලකුණු හතළිහකට (40) ඉහළ ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

| අනු අංකය | නිර්ණායක |
|---|---|
| 1 | අමතර අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |

| | |
|---|---|
| 3 | රැකියා පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**6. සේවා නියමයන් හා කොන්දේසි:-**

**(i)** මෙම තනතුරු ස්ථිරය. මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

**(ii)** තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

**(iii)** තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

**(iv)** තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

**(v)** තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ඇත.

**7.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය:-

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**8.** රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**9.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**10.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**11.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරනු ලබන්නේ නම්) හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර**
**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2025 .................... වැනි දින.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

**ආදර්ශ අයදුම්පත්‍රය**

…………………………………………………….. **තනතුර**

01. (අ) මුලකුරු සමග නම (**සිංහලෙන්**): ....................................................................................
……………………………………………………………………………

(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම (**සිංහලෙන්**): ........................................................
……………………………………………………………………………
……………………………………………………………………………

(ඇ) සම්පූර්ණ නම (**ඉංග්‍රීසි කැපිටල් අකුරින්**): ……………………………………..
……………………………………………………………………………
……………………………………………………………………………

02. ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය: ..........................................................................................
……………………………………………………………………………
……………………………………………………………………………

දුරකථන අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

වට්ස්ඇප් අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය: ..........................................................................................
……………………………………………………………………………
……………………………………………………………………………

දුරකථන අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය
පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (අ) උපන් දිනය: ..................................................
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස: අවුරුදු........ මාස........ දින........

05. සිවිල් තත්ත්වය: ......................................

06. ස්ත්‍රී/පුරුෂ භාවය: .....................................

07 . ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව: ( ඔව් / නැත )

08. අධ්‍යාපන සුදුසුකම්: (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

අ.පො.ස. (උ/පෙළ)

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

අ.පො.ස. (සා/පෙළ)

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. වෘත්තීය සුදුසුකම්: (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| පාඨමාලාව | ආයතනය | බල පැවැත්වෙන දිනය |
|---|---|---|
| | | |
| | | |

10. පළපුරුද්ද: (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |
| | | |

11 . වත්මන් රැකියාව පිළිබඳ විස්තර:-

(අ) ආයතනයේ නම හා ලිපිනය: ............................................................................

(ආ) මුල් පත්වීමේ දිනය: ...................................................................................

(ඇ) දැනට දරන තනතුර: ...................................................................................

(ඈ) මාසික මූලික වැටුප: ..................................................................................

(ඉ) දීමනා: .....................................................................................................

(ඊ) දළ වැටුප: ................................................................................................

12 . ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? ( ඔව් / නැත )
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.
..........................................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? ( ඔව් / නැත )
එසේ නම් එම විස්තර සඳහන් කරන්න.
..........................................................................................................................

මවිසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

දිනය :.............................. ..................................................

අයදුම්කරුගේ අත්සන

## <u>දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

**(රාජ්‍ය ආයතනවල/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ............................................ තනතුර දරන, .................................................... මයා / මිය / මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති / නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : ...............................

.....................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)